C
305.4
MAN

# ශ්‍රී ලංකාවේ මහවැලි ජනාවාසයන්හි පවුල තුළ කාන්තාවන්ගේ වෙනස්වන කාර්යභාරය පිළිබඳව සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්: මහවැලි “සී” කලාපය ආශ්‍රයෙන්

UNIVERSITY OF PERADENIYA
FACULTY OF ARTS
29 JUL 1999
SENIOR ASST. REGISTRAR

# ROLE CHANGES OF WOMEN WITHIN THEIR FAMILIES IN MAHAWELI RESETTLEMENTS OF SRI LANKA : A SOCIOLOGICAL STUDY OF MAHAWELI SYSTEM “C”

එම්. ජී. මනුරත්න

මෙම ස්වාධීන නිබන්ධනය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි

1999

524923

## සාරාංශය

මෙම නිබන්ධනයෙන් නෙල්දෙණියාය මහවැලි ජනාවාසයන් හි පවුල තුළ කාන්තාවන්ගේ කාර්යභාරයන් හි ඇති වූ වෙනස්කම් ඔවුන්ගේ මූල්ගම් හා සංසන්දනාත්මකව අධ්‍යයනය කෙරිණි. ජනාවාසයේ ප්‍රජාව තුළ කාර්යභාරයන්හි වෙස්කම් අධ්‍යයනය කිරීමේ දී පවුල් වර්ග (මූල් පවුල්, අනුපවුල් හා අනවසර පවුල්) සහ ස්ත්‍රී - පුරුෂ වශයෙන් පවතින වෙනස්කම් අනුව එය සිදු කරන ලදි.

අධ්‍යයනය සඳහා දත්ත ලබා ගැනීමේ දී සමාජ විද්‍යා හා මානව විද්‍යාත්මක ක්‍රමවේදයන් වන ප්‍රත්‍යෙක අධ්‍යයන, සෘජු නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා හා සමීක්ෂණ මගින් දත්ත රැස්කර ගන්නා ලදි. මෙම අධ්‍යයනය 1998 ඔක්තෝබර් මස සිට 1999 මාර්තු මස දක්වා වන “මහ” වගා කන්නයේ දී සිදු කරන ලදි.

අධ්‍යයනයට අනුව ජනාවාසය තුළ කාන්තාවන්ගේ කාර්යභාරයන් හි වෙනස්වීම් කෘෂිකාර්මික ක්ෂේත්‍රය, ගෘහ කටයුතු, අසල්වාසීන් හා ප්‍රජාව සමග සම්බන්ධතා පැවැත්වීම්, ආර්ථික නොවන කෘෂිකාර්මික කටයුතු ආශ්‍රිතව විද්‍යාමාන විය. කෘෂිකාර්මික කටයුතුවල දී කාන්තාවන් ඒ ආශ්‍රිත විවිධ වැඩ කටයුතුවල යෙදුන අතර එම සියලුම කටයුතුවල දී කාන්තාව පුරුෂයාට වඩා වැඩි කාලයක් ගතකොට තිබුණි. මෙම ස්වාභාවය සාම්ප්‍රදායික ශ්‍රම විභජන රටාවන් කෙරෙහි බලපෑම් කොට තිබුණි. ගොඩ ගොවිතැනේ දී සම්පූර්ණ ම කාර්යභාරය කාන්තාවට පැවරී තිබූ අතර එම කටයුතු සියල්ල ම පාහේ ඇය විසින් ඉටු කරනු ලබන්නී ය. ජානපදික කාන්තාවන් මෙම කටයුතු සියල්ල කරනු ලබන්නේ ඔවුන්ගේ හුදකලා වූ පවුල් තුළ කෙරෙන ගෘහ කටයුතුවලට අමතර ව වන අතර මේ නිසා ඔවුන්ගේ කාර්යය ක්ෂේත්‍රය ඔවුන් සිටි පුරාණ ගමට වඩා අධික ලෙස පුළුල් වී තිබුණි. කාන්තාවගේ කාර්යයන් පවුල් අනුව

විචලනය වන අතර මූල් පවුල්වල කාන්තාවන් මෙසේ අධික ලෙස කාර්යය විපරිනාමයකට ලක් වී ඇත.

මෙම අධ්‍යයනයට අනුව පවුල තුළ කාන්තාවගේ කාර්යභාරයේ ඇති වූ වෙනස්කම් බෝඩියෝගේ "ක්ෂෙත්‍රය" (field) යන ක්‍රමවේදය පදනම් කරගෙන විග්‍රහ කෙරේ. එසේ මහවැලි ජනාවාසවල කාන්තාවගේ වැඩ සහ වගකීම් වැඩිවීම නිසා එම කාන්තාවට කිසියම් ස්වාධීනතාවක් ඇතැයි යන තර්කය මෙම අධ්‍යයනය මගින් ප්‍රතික්ෂේප කරයි.

කාන්තාවගේ කාර්යභාරයන් හි ඇති වූ වෙනස්වීම් හා එම කාර්යයන් පවුල තුළ ක්‍රියාත්මක වන ආකාරය අනුව ස්ත්‍රී - පුරුෂභාවය පිළිබඳ නව දෘෂ්ටිකෝණයක් (perspective) ලබාදෙන අතර එය මහවැලි ජනාවාසවල පවුල් අර්බුද කෙරෙහි බලපෑම් ඇති කරනවා ය යන්න මෙම අධ්‍යයනයෙන් දැක්වේ.